# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 10 ශ්‍රේණිය

## පුරවැසි අධ්‍යාපනය　　　　කාලය : පැය 3

1) සමාජ සුරක්ෂිතතාවය සඳහා පවුලකින් ඉටුවිය යුතු වැදගත් කාර්යයක් වන්නේ,
   1. සමාජ යුතුකම් හා වගකීම් ඉටු කිරීම
   2. ප්‍රජා සෞඛ්‍ය සේවා පවත්වාගෙන යාම
   3. සමාජ විනය හා ශික්ෂණය ඇති කිරීම
   4. ආදර්ශයෙන් මඟ පෙන්වීම

2) ප්‍රජාතන්ත්‍රවාදයේ සාර්ථකත්වය තීරණය වීම කෙරෙහි බලපාන සාධකයක් නොවන්නේ,
   1. මාධ්‍ය නිදහස ක්‍රියාත්මක කිරීම
   2. රට තුළ ආධිපත්‍ය ක්‍රියාත්මක කිරීම
   3. සුබසාධන සේවා සීමා කිරීම
   4. ප්‍රබල විරුද්ධ පක්ෂයක් තිබීම

3) සර්වජන ඡන්ද බලය හිමිවන වයස් සීමාව අවුරුදු 21 - 18 දක්වා අඩු කරනු ලැබුවේ,
   1. 1958
   2. 1963
   3. 2001
   4. 1984

4) බ්‍රිතාන්‍ය පාලන යුගයේදී නිකුත් කළ පලාත් පාලන ආයතන සම්බන්ධ ආඥාපනතක් නොවන්නේ,
   1. ක්‍රි. ව. 1865 දී අංක 17 දරන මහනගර සභා ආඥා පනත
   2. ක්‍රි. ව. 1874 අංක 26 දරණ ගම් කාර්ය සභා ආඥා පනත
   3. ක්‍රි. ව. 1939 දී අංක 61 දරණ නගර සභා ආඥා පනත
   4. 1946 දී අංක 03 දරණ සුළු නගර සභා ආඥා පනත

5) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන ක්‍රියාත්මක වූයේ,
   1. 1987 පසුව
   2. 1946 පසුව
   3. 2004 පසුව
   4. 1997 පසුව

6) දේශසීමා පදනම් කරගත් ගැටුම් අයත් වන්නේ,
   1. සමාජ මූල මත ඇතිවන ගැටුම්
   2. ආර්ථික මූල මත ඇතිවන ගැටුම්
   3. දේශපාලන මූල මත ඇතිවන ගැටුම්
   4. පුද්ගල මූල මත ඇතිවන ගැටුම්

7) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය මුලින්ම ක්‍රියාත්මක කළේ,
   1. ඉන්දියාවේ
   2. චීනයේ
   3. ග්‍රීසියේ
   4. ලංකාවේ

8) ඍජු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය සඳහා සහභාගී වීමට හැකි වූයේ,
   1. වහලුන්ට
   2. කාන්තාවන්ට
   3. විදේශිකයන්ට
   4. නගර වැසි පිරිමින්ට

9) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය පවතින රටවල ඇතැම් අවස්ථාවලදී ඍජුවම මහජන අදහස් විමසන අවස්ථාව වන්නේ,
   1. ජනාධිපතිවරණයේදී
   2. ජනමතවිචාරණයේදී
   3. ප්‍රාදේශීය සභා මැතිවරණයේදී
   4. පළාත්සභා මැතිවරණයේදී

- පහත 10 සිට 20 දක්වා ඇති ප්‍රකාශන හරි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.

10) 17 වන සියවසේදී නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය යුරෝපයේ පාලන ක්‍රමයක් ලෙස ප්‍රචලිත වී තිබුණි. ( )

11) මහජන තැමැත්ත මත පාලන කටයුතු සිදුවීම ප්‍රජාතන්ත්‍රවාදයේ සුවිශේෂී ලක්ෂණයකි. ( )

12) සර්වජන ඡන්ද බලය රටේ සියළුම දෙනාට හිමිවන ඡන්ද බලයකි. ( )

13) මහා බ්‍රිතාන්‍යයේ ඒක පක්ෂ ක්‍රමය ක්‍රියාත්මක වේ. ( )

14) තරඟකාරී පක්ෂ ක්‍රමයේ යහපත් ලක්ෂණයක් වන්නේ බහුවිධතාවය තුළින් එක්සත් බව රැක ගැනීමයි. ( )

15) ජනගහනය යනු ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම සඳහා යොදා ගන්නා එක් නිර්ණායකයකි. ( )

16) අයිතිවාසිකම් යනු සෑම පුද්ගලයෙකුටම සම අවස්ථා ලබා දීමයි. ( )

17) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රටක මූලික නීතියයි. ( )

18) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීමෙන් සියල්ලටම නීතියේ රැකවරණය ලැබේ. ( )

19) රටක සියල්ලටම ඉහළින් නීතිය පැවතීම නීතියේ ආධිපත්‍යයි. ( )

20) රාජ්‍ය යනු විටින් විට වෙනස්වීම්වලට භාජනය වන ආයතනයකි. ( )

21) රාජ්‍යයක් තුළ දක්නට ඇති මූලික ලක්ෂණයක් නොවන්නේ,
1. භූමිය
2. ආණ්ඩුව
3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
4. ජනගහනය

22) යුරෝපයේ ජාතික රාජ්‍ය ක්‍රමය ආරම්භ වූයේ,
1. ක්‍රි. ව. 12 වන සියවසේදී
2. ක්‍රි. ව. 15 වන සියවසේදී
3. ක්‍රි. ව. 22 වන සියවසේදී
4. ක්‍රි. ව. 17 වන සියවසේදී

23) ජාතික රාජ්‍ය බිහිවීමට බලපෑ හේතුවක් නොවන්නේ,
1. ජාතික ඒකාග්‍රතාවය
2. පුනරුදය
3. විද්‍යාත්මක දැනුම
4. රෙපරමාදු ආගමික ප්‍රතිසංස්කරණ

24) යුරෝපයේ බිහි වූ ප්‍රථම ජාතික රාජ්‍යක් වන්නේ,
1. ඉතාලිය
2. ජර්මනිය
3. ප්‍රංශය
4. කැනඩාව

25) පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයකදී,
1. ජනාධිපතිවරයා ව්‍යවස්ථාදායකයට වගකීමට සෘජුව බැඳී නොසිටී.
2. ජනාධිපතිවරයා විධායකයේ ප්‍රධානියා බවට පත් වේ.
3. ව්‍යවස්ථාදායකය මගින් විධායකය පාලනය නොකරයි.
4. විධායකය සෘජුවම පාර්ලිමේන්තුවට වග කිව යුතුය.

26) ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ජනතාව සතු බලය හඳුන්වන්නේ,
1. නීතියේ ආධිපත්‍ය බලය
2. සර්වජන ඡන්ද බලය
3. පරමාධිපත්‍ය බලය
4. අධිකරණ බලය

27) බලයේ ස්වරූපයක් නොවන්නේ.
1. රාජ්‍ය බලය
2. ආර්ථික බලය
3. පරිපාලන බලය
4. සමාජ බලය

28) බලයට අයත් නොවන මූලික සාධකයක් වන්නේ,
1. පාලන බලතල
2. ආර්ථික බලතල
3. මූලික අයිතිවාසිකම්
4. ඡන්ද බලය

29) ස්විට්සර්ලන්තයේ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ආන්ඩු හඳුන්වනු ලබන්නේ,

1. ප්‍රාන්ත නමින්
2. කැන්ටන් නමින්
3. පළාත් පාලන ආයතන නමින්
4. ප්‍රාදේශීය පාලන ඒකක නමින්

30) මහ නගර සභාවක ප්‍රධාන පරිපාලන නිලධාරියා වන්නේ,

1. සභාපති
2. නගරාධිපති
3. ජනාධිපති
4. අගවිනිසුරු

31) ඇමරිකා එක්සත් ජනපදය නම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය කර ගනු ලැබුවේ,

1. ක්‍රි. ව. 1787
2. ක්‍රි. ව. 1868
3. ක්‍රි. ව. 1684
4. ක්‍රි. ව. 1964

- පහත ප්‍රකාශ කියවා 32 හා 33 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. බැංකු කටයුතු
B. යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීම
C. මහාමාර්ග
D. බෝවන රෝග වැළැක්වීම
E. විදේශ කටයුතු
F. ආගමන කටයුතු

32) ස්විට්සර්ලන්තයේ මධ්‍යම ආණ්ඩුව සතු බලතල මොනවාද?

1. ABR 2. BEF 3. AED 4. FDB

33) ස්විට්සර්ලන්තයේ ප්‍රාන්ත රාජ්‍යයන්ට හිමි බලතල මොනවාද?

1. BEC 2. CFD 3. EDB 4. AFE

34) 'සංකේතානුසාරයෙන් සමාජයීය ලෙස හිමිකොට ගන්නා වූද පාරම්පරික වශයෙන් අත්පත් කොට ගත්තා වූද සියලුම චර්යා රටාවන්ට දිය හැකි සාමූහික නාමය සංස්කෘතියයි.'

මෙම ප්‍රකාශය ඉදිරිපත් කළේ,

1. ටී. බී. ටයිලර්
2. මහාචාර්ය ගානර්
3. ජී. ඩී. එච්. කෝල්
4. චාල්ස් ඒ. එල්වුඩ්

35) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික රටක් වීම කෙරෙහි බලපා ඇති සාධකයක් නොවන්නේ,

1. සංක්‍රමණ
2. ශ්‍රමිකයින් ගෙන්වා ගැනීම
3. අධිකරණ තීන්දු
4. ආක්‍රමණ

36) ආර්ථික භාණ්ඩයක් නොවන්නේ,

1. ආහාර 2. ඖෂධ 3. ඇඳුම් 4. වාතය

37) නිෂ්පාදන සාධක හා ඒවාට කරන ගෙවීම් නිවැරදිව අඩංගු පිළිතුර වන්නේ,

1. පොලිය - ව්‍යවසායකත්වය
2. ලාභය - භූමිය
3. වැටුප - ප්‍රාග්ධනය
4. බදු කුලිය - භූමිය

38) කාර්මික නිෂ්පාදනයක් වන්නේ,

1. වී 2. ඇඟලුම් 3. මස් 4. තේ

39) ප්‍රාග්ධන භාණ්ඩයක් වන්නේ,

1. ගොඩනැගිලි
2. පොහොර
3. ඖෂධ
4. දැව

40) ආර්ථිකයක සිදුවන ක්‍රියාවලියක් නොවන්නේ,

1. නිෂ්පාදනය
2. ප්‍රවාහනය
3. බෙදාහැරීම
4. පරිභෝජනය

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1)

1. ඕනෑම රටක ආර්ථිකයක සිදුවන ක්‍රියාවලි තුනෙන් දෙකක් ලියන්න.
2. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මූලික ලක්ෂණ 2ක් ලියන්න.
3. ශිෂ්‍යයෙකු වශයෙන් ඔබ සතු අයිතිවාසිකම් 2ක් ලියන්න.
4. ඒක පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන රටවල් 2ක් ලියන්න.
5. ගැටුම් නිරාකරණය සඳහා අවශ්‍ය ගුණාංග 2ක් ලියන්න.
6. සප්ත අපරිහානීය ධර්ම 2ක් ලියන්න.
7. රාජ්‍යක දක්නට ලැබෙන මූලික ලක්ෂණ 2ක් ලියන්න.
8. අනුරාධපුර යුගයේදී පණ්ඩුකාභය රජු විසින් ගම් පාලනය සඳහා පත්කළ නිලධාරීන් 2ක් නම් කරන්න.
9. ඉතා සංකීර්ණ බහු සංස්කෘතික සමාජයක් දැකිය හැකි රාජ්‍ය 02 ලියන්න.
10. නීතිය ක්‍රියාත්මක වන ආකාරය අනුව බෙදෙන ප්‍රධාන කොටස් 02 ලියන්න.

2)

1. පාලන ක්‍රමයක් ලෙස ඍජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටලු 2ක් ලියන්න.
2. ජීවන ක්‍රමයක් ලෙස ප්‍රජාතන්ත්‍රවාදය වැදගත් වීමට බලපා ඇති හේතු 3ක් ලියන්න.
3. ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක ජීවත් වීමේදී ඔබ විසින් ඔබ තුළ වර්ධනය කර ගත යුතු ගුණාංග 3ක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න.

3)

1. බහු පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන රටවල් 2ක් ලියන්න.
2. තරඟකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණ 3ක් ලියන්න.
3. නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණ 3ක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න.

4)

1. බස්නාහිර පළාතට අයත් මැතිවරණ දිස්ත්‍රික්ක 2ක් ලියන්න.
2. ඡන්ද කොට්ඨාස අනුව නියෝජිතයින් තෝරා ගැනීමේ ප්‍රයෝජන 03ක් ලියන්න.
3. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය සාර්ථක වීමට විරුද්ධ පක්ෂයෙන් වන ආයකත්වය කරුණු 3ක් ඇසුරින් පැහැදිලි කරන්න.

5)

1. ආණ්ඩුවේ ප්‍රධාන ආයතන 2ක් ලියන්න.
2. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පැවැත්ම සඳහා නිදහස් මාධ්‍ය මඟින් ඉටු කරන කාර්යයන් 3ක් ලියන්න.
3. ජාතික රාජ්‍යක ප්‍රධාන ලක්ෂණ 3ක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න.

6)

1. රාජ්‍යයන්ගේ ප්‍රධාන ස්වරූප 2 ලියන්න.
2. ජාතික රාජ්‍ය බිහි වීමට බලපෑ හේතු 3ක් ලියන්න.
3. ආණ්ඩුවක ප්‍රධාන ආයතන තුනක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න.

7)

1. ව්‍යවස්ථාදායකය සතු කාර්යයන් 2ක් දක්වන්න.
2. අධිකරණය සතු කාර්යයන් 3ක් ලියන්න.
3. පුරවැසියා කෙරෙහි රාජ්‍යයෙන් ඉටුවිය යුතු කාර්යයන් 3ක් ලියා ඉන් එකක් පැහැදිලි කරන්න.

8)

1. සන්ධීය ආණ්ඩුක්‍රම පවතින රටවල් 2ක් දක්වන්න.
2. ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රාන්ත රාජ්‍යන්ට හිමි බලතල 3ක් ලියන්න.
3. බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමේ ඇති වැදගත්කම කරුණු තුනකින් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න.